# MANRECAP මාසික පුවත් නිවේදනය #16

| ජනවාරි 2007- මාර්තු 2007 | #16 |
|---|---|

## 1. ප්‍රජා සහභාගීත්වය සහ ප්‍රජා මූලික සංවිධාන සඳහා වූ මැන්රිකැප් සම්මන්ත්‍රණය




මැන්රිකැප් සංවිධානය 2004 වර්ෂයේ ව්‍යාපෘති ආරම්භයේදී පටන්ම උතුරු ප්‍රදේශයේ CBO සංවිධාන සමඟ ඉතා සුහද ශීලීව කටයතු කිරීම නිසා ලබාගත් අත්දකීම් බොහෝය. මේ ආකාරයෙන් ලබා ගත් අත්දකීම විශේෂයෙන් ම ක්ෂේත්‍ර නිලධාරීන්ට විශේෂ ප්‍රයෝජනයක් විය. මේ ක්ෂේත්‍ර නිලධාරීන් විශේෂයෙන්ම රාජකාරි මට්ටමෙන් මෙම සංවිධාන ශක්තිමත් කිරීමට සහ අධීක්ෂණයට ලක්කිරීම ඔවුන්ගේ රාජකාරියකි.

2007 පෙබරවාරි 12 වන දින මන්නාරම් දිස්ත්‍රික්කයේ ලේකම් කාර්යාලයේදී ප්‍රදේශයේ ග්‍රාම සංවර්ධන නිලධාරීන් සමාජසේවා නිලධාරීන්, සංස්කෘතික නිලධාරීන් සහ ව්‍යාපෘති සහායකයින්ද එක්රැස්කොට එක් දිනක වැඩ මුලුවක් පවත්වන ලදී. මේ වැඩ මුලුවේ තේමාව වූයේ ප්‍රජා සහභාගීත්වය සහ ප්‍රජා මූලික සංවිධාන ශක්තිමත් කිරීමයි.

මේ වැඩ මුලුවේ ප්‍රධාන ඉලක්කය වූයේ CBO (ප්‍රජා මූලික සංවිධාන) වල ගිණුම් කටයුතු ගැන, සහ ක්ෂේත්‍ර නිලධාරින්ට ප්‍රජා සහභාගි වැඩ සටහන් ගැන අවබෝධයක් සහ ඒවායේ නිසි රෙගුලාසි ගැන අවබෝධයක් ලබාදීමයි.

දිස්ත්‍රික් ග්‍රාමසංවර්ධන නිලධාරීන් ද එමෙන්ම වැඩමුලුවට සහභාගී වූ අනෙකුත් හැකියා මේ වැඩමුලුවේ තිබුණු වැදගත්කම් හා වටිනාකම ගැන ඇගයීම් කරන ලදී. මේ පුහුණු වැඩ සටහන් වල ඇති වටිනාකම වටහා ගත්තද එවැනි වැඩ සටහන් නිතර පැවැත්වීමට නොහැකිවී ඇත්තේ අවශ්‍ය මුදල් නොමැති නිසාය. දිස්ත්‍රික් ග්‍රාමසංවර්ධන නිලධාරීන් සහ වැඩ මුළුවට සහභාගී වූ වත් මේ CBO සහ ක්ෂේත්‍ර මට්ටමේ නිලධාරීන්ගේ සහික සංවර්ධනය මෙවැනි සම්බන්ධකම් නිරන්තර පැවැත්වීම ඉතාම අත්‍යවශ්‍ය වන බවට ඔවුන් සියලු දෙනාත්ම එකඟතාවය පළවිය.

## 2. සුළු පරිමාණ මූල්‍යමය ක්‍රියාකාරීත්ව යන්



උතුරු ප්‍රදේශයේ ආරක්ෂක තත්වය පහත වැටීමෙන් පසු මේ ව්‍යාපෘතියට කාන්තා බැංකු ක්ෂේත්‍රයේ අධීක්ෂකවරියන් කොළඹ සිට මන්නාරමට ගෙන්වා ගැනීම අපහසුවීම නිසා පසුගිය වසරක පමණක කාලය තුල පසු විපරම් වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමට නොහැකි විය.

කෙසේ වුවත් මේ ක්‍රියාකාරීත්වයන් ප්‍රාදේශීය සම්පත් දායකයෙක් යටතේ පවත්වා ගෙන ගියත් ඔවුනට තවත් විශේෂ ගුරුහරුකම් හා අවවාද අවශ්‍යව ඇත්තේ ප්‍රදේශයේ ඉතුරු කිරීමේ කාන්තා කණ්ඩායම් සහ බැංකු ශක්තිමත් කිරම සඳහාය.

ඉහත සඳහන් අදහස ඉටුකර ගැනීම සඳහා මේ ව්‍යාපෘතිය, මගින් ශාන්තිපුරම් සහ වඩ්ඩු පිත්තමාඩු ප්‍රදේශයේ බැංකු වල ප්‍රධානීන් උතුරු නැගෙනහිර පාලනයෙන් පිට ළඟින්ම පිහිටි නගරය වන තිරප්පනේ නගරයට කොළඹින් ඉතිරිකිරීම් බැංකුවේ වනිතා ඒකකයේ කිහිපදෙනෙක් ගෙන්වා සංවාදයක් පවත්වන ලදී.

මේ හමුවේදී ප්‍රදේශයේ බැංකුවල ඉතිරිකිරීමේ ගිණුම් බැංකු පොත් පවත්වා ගෙන යන විට සිදුවී ඇති වැරදි කිහිපයක් ම පෙන්වා දෙන ලදී. මේ සම්බන්ධයෙන් මන්නාරම් බැංකු ප්‍රධානීන්ට ප්‍රායෝගික උපදෙස් ලබා දෙන ලදී.

මේ හමුවේ දී ප්‍රදේශයේ බැංකුවල ඇති දයකයින්ගේ ඉතිරිකිරීම් ගිණුම් පොත්වල ඇති වැරදි සටහන් කිහිපයක් ම පෙන්වා දී ඒවා නිවැරදි කිරිමට ප්‍රදේශයේ බැංකු ප්‍රධානීන් ට නියමිත උපදෙස් දෙන ලදී. මේ හමුව තුලින් එක් එක් ප්‍රාදේශීය බැංකුවල ඇති දුර්වලකම් හා හැකියාවක් ද එලි දක්වීම නිසා ඉලක්ක ගම්මාන වල සහයෝගිතාවය දක්වීම කෙසේ කළ යුතුදැයි තීරණය කිරීමට පහසුය. මාස දෙකකට වරක් මේ ව්‍යාපෘතිය දිගටම ක්‍රියාත්මක කිරීමට තීරණය විය.

## 3. මාන්තායි බටහිර උපදිසාපති කොට්ඨාශයේ ගම්මාන වල ඇතුලත මාර්ග අලුත්වැඩියා කිරීම.



මන්තායි බටහිර උප දිසාපති කොට්ඨාශය තුල සේවා ගම, ගනේෂපුරම් සහ පලි ආරු යන ගම්මාන වලට අයත් අභ්‍යන්තර පාරවල් ප්‍රතිසංස්කරණය කිරීමට මේ ව්‍යාපෘතියේ තුන්වන අවුරුද්ද තුල නිම කිරීමට සැලසුම් කර ඇත. සේවා ගමේ පාරවල් වල වැඩ කටයුතු දනට සම්පූර්ණ කර ඇත. නමුත් සමහර පාලම් වල අලුත් වැඩියා කටයුතු ලබන වර්ෂයතුල නිම කිරීමට කටයුතු සැලසුම් කලේ ප්‍රදේශයේ පවත්නා සිමෙන්ති හිඟය නිසාය.

ගනේෂපුරම් සහ පලිආරු ගම්මාන වල රාජ්‍ය ඉඩම් නැවත බෙදවෙන් කිරිම නිසා කැලෑ එලි කිරීමේ කටයුතු ප්‍රමාද විය. ඒ නිසා 3 වන අවුරුද්ද තුල පැති කාණු හැරීම සහ පාරවල් ගොඩ කිරීමේ කටයුතු සිදු විය. මේ වැඩ කටයුතු 4 වන අවුරුද්ද හෙවත් ලබන අවුරද්ද තුලදී සම්පූර්ණ කෙරේ.

මන්තායි බටහිර උප දිසාපති කොට්ඨාශය තුල මැන්රිකැප් ව්‍යාපෘතියේ ප්‍රජා පාලන පුනරුත්ථාපන කටයුතු ආරක්ෂක තත්වය ඉතාම නරක තත්වයට පත්වීමෙන් පසුවත් දිගටම පවත්වාගෙන යෑම විශේෂයෙන්ම සඳහන් කළ යුත්තකි. හේතුව වෙනත් අන්තර් ජාතික සංවිධාන සහ රාජ්‍ය නොවන සංවිධාන වල වැඩ කටයුතු වලට අතිශයින් බාධා පැමිණ ඇත. මේ නිසාම මැන්රිකැප් ව්‍යාපෘතියේ වැඩ කටයුතු නිසා ප්‍රදේශයේ ජනතාවට වෙන කිසිම කටයුත්තක් කර ගැනීමට නොහැකි අවස්ථාවක ආදයම් මාර්ගයක් පවත්වා ගැනීමට අවස්ථාව උදව් ඇත.

PHOTO: සේවා ගමෙහි අභ්‍යන්තර පාරවල් පුණරුත්තාපනය කිරීම.

## 4. මූල්‍ය කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩ සටහනේ පසු විපරම

CBO සංවිධාන වල නායකයින් මේ නිවැරදි කිරීමේ පිලිවෙතක් වශයෙන් 2007 මාර්තු මාසයේ දී තවත් පුහුණු වැඩ සටහනක් විශේෂයෙන්ම CBO සංවිධාන වල සභාපති, භාණ්ඩාගාරික, ලේකම් යන අය සඳහා පවත්වනු ලැබීය. මෙහි ප්‍රධාන අරමුණ වූයේ මේ සංවිධාන වලට තමන්ගේ මූල්‍ය ගණුදෙනු ක්‍රමානු කූලව නිවැරදිව ගිණුම් ගත කිරීම, නිවැරදි ලේඛන පවත්වා ගෙන යෑම සහ මූල්‍ය ගනුදෙණු මනා පාලනයක් ඇතුව පවත්වා ගෙන යෑම යනාදී කරුණුය. මේ වැඩ මුලුව සඳහා 11 දෙනෙකු සහභාගී විය.